# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2019

## (AA26) ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග

(Business Management and strategy)

මෙම ප්‍රශ්න පත්‍රය **A, B, C, D** යනුවෙන් කොටස් හතරකින් යුක්තව ප්‍රශ්න 10 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලිවීම අනිවාර්ය වේ.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 10 කින් සමන්විත වන අතර එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20 කි.

අංක **1.1** සිට අංක **1.5** දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරාගෙන, තෝරාගත් උත්තරයට අදාල අංකය පමණක් උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. මෙවර නිසිලෙස උපදෙස් පිළිපදිමින් උත්තර සපයා ඇති බව දක්නට ලැබුණු අතර, ඉතාමත් සුළු පිරිසක් අදාල උපදෙස්වලට අවධානය යොමු නොකර උත්තර ඉදිරිපත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකයට අනුව උත්තර පත්‍රයේ සඳහන් කළ යුතු වුවද, කිපදෙනෙක් තෝරාගත් උත්තරය ප්‍රශ්න පත්‍රයේ ලියා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් 1.4 ප්‍රශ්නය සඳහා නිවැරදි උත්තරය ලබා දී නොතිබුණි. අයදුම්කරුවන් බහුතරයකට සංවිධාන සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් නොතිබූ බව මෙමගින් පැහැදිලි විය.

ප්‍රශ්න අංක **1.6** සිට **1.10** දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රශ්න අංකය සමග උත්තර පත්‍රයේ ලිවීමට නියමිතව තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සාර්ථකව උපදෙස් අනුගමනය කරමින් උත්තර ලියා තිබූ අතර, සුළු පිරිසක් සත්‍ය අසත්‍ය වෙනුවට "√" සහ "**x**" ලකුණු යොදා දක්වා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න පහකින් සමන්විත වූ අතර එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 කි.

### ප්‍රශ්න අංක 02

සංවිධානයක පිහිටුවා ඇති ඉලක්ක ඉටුකර ගැනීම සඳහා සඵලදායී අන්දමට සංවිධානයේ හිඟ සම්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් කළමනාකරුවන් වගකිව යුතු වේ. ව්‍යාපාර සංවිධානයක ඇති මට්ටම් මත පදනම්ව කළමනාකරුවන්ව ධූරාවලියක පිහිටුවිය හැකිය. ඒ අනුව කළමනාකරුවන්ගේ මට්ටම් 3 ක් හඳුනාගත හැකිය. එක් එක් මට්ටම් සඳහා උදාහරණයක්ද සහිතව කළමනාකරුවන්ගේ මට්ටම් 3 පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි.

පොදුවේ ගත්කළ බහුතරයක් අයදුම්කරුවන් සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණු අතර, ඇතැම් සුළු අයදුම්කරුවන් පිරිසක් කළමනාකරණ මට්ටම් 3 පමණක් සඳහන් කර සාර්ථක පැහැදිලි කිරීම්වලින් තොරව ඒ ඒ මට්ටම් සඳහා ගැලපෙන උදාහරණ සඳහන් නොකිරීම නිසා මුළු ලකුණු ලබාගැනීමට නොහැකි වී තිබුණි. සමස්තයක් ලෙස සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

නිලතන්ත්‍රවාදය පිළිබඳ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය. එහි පළමු කොටසින් නිලතන්ත්‍රවාදයේ ලක්ෂණ 3 ක් සඳහන් කරන ලෙසත් දෙවන කොටසින් නිලතන්ත්‍රවාදයේදී මුහුණ දෙන අභියෝග 2 ක් සඳහන් කරන ලෙසත් දක්වා තිබුණි. නිලතන්ත්‍රවාදය පිළිබඳ දැනුවත්භාවයේ අඩුවක් දක්නට ලැබුණි.

සමස්තයක් ලෙස බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා නොතිබුණි. අයදුම්කරුවන් සීමිත ප්‍රමාණයක් මෙම කොටස් දෙකට අදාලව උත්තර සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

සැලසුම්කරණ ක්‍රියාවලියේ පළමු පියවර ලෙස සංවිධානයක් සඳහා පරිසර විශ්ලේෂණයක් සිදුකිරීමේ වැදගත්කම පැහැදිලි කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි.

සමස්තයක් ලෙස මේ සඳහා උත්තර ඉදිරිපත් කිරීම සාමාන්‍ය මට්ටමක පැවතුණි. බහුතරයක් අයදුම්කරුවන් PEST විශ්ලේෂණය සහ SWOT විශ්ලේෂණය පමණක් සඳහන් කර තිබුණද, එය සිදුකිරීම සැලසුම් ක්‍රියාවලියට වැදගත්වන ආකාරය පැහැදිලි කර නොතිබුණි. තවද, ඇතැම් අයදුම්කරුවන් සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවරයන් ඉදිරිපත් කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. මෙහිදී වැදගත් වන්නේ පරිසර විශ්ලේෂණය සිදුකිරීම තුලින් එය සංවිධානයට වැදගත් වන ආකාරය ඉදිරිපත් කිරීමයි. බහුතරයක් අයදුම්කරුවන් එලෙස කරුණු ඉදිරිපත් කර නොතිබුණි. ඉතාම සුළු පිරිසක් සාර්ථකව කරුණු ඉදිරිපත් කරමින් ප්‍රශ්නයට අදාල මුළු ලකුණු ලබාගත් අවස්ථාද දක්නට ලැබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

කළමනාකරුවෙකුට තීරණ ගැනීම වැදගත් වන්නේ කුමක් නිසාද යන්නට හේතුන් 3 ක් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තර සපයා නොතිබූ හෙයින් ප්‍රශ්නය තේරුම් ගැනීමේදී විවිධ දුෂ්කරතා පැන නැගී ඇතැයි නිගමනය කළ හැකිය. මේ සඳහා නිවැරදි තීරණ ගැනීම තුලින් සංවිධානයකට සිදුවිය හැකි ප්‍රතිලාභ විස්තරාත්මකව පැහැදිලි කළ හැකිව තිබුණි.

අයදුම්කරුවන් සමහරක් කළමනාකරුවා කවරෙක්ද යන්න විස්තර කර තිබුණි. එමනිසා බහුතරයක් අයදුම්කරුවන්ට මේ සඳහා ප්‍රමාණවත් ලකුණු ප්‍රමාණයක් ලබාගත නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

වෙනස කළමනාකරණය, සංවිධාන සහ පුද්ගල මට්ටම් යන පැතිකඩයන් දෙකටම අනුව වෙනස හසුරුවන ක්‍රමානුකූල ප්‍රවේශයකි. වෙනසේ ස්වභාවය විවිධාකාරයෙන් වර්ගීකරණය කළ හැකිය. ඒ අනුව වෙනසේ වර්ග දෙකක් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි.

මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් උත්තර සපයා නොතිබූ අතර, තවත් සමහරෙක් උත්තර ලිවීම මගහැර තිබුණි. උත්තර ඉදිරිපත් කළ අයදුම්කරුවන් වුවද ප්‍රශ්නයට අදාල නොවන කරුණු ඉදිරිපත් කිරීම නිසා ලකුණු ලබා ගැනීමට අසමත් වී තිබුණි. විභාගය සඳහා නිසි සූදානමක් තිබුණිනම් මෙම ප්‍රශ්නය සඳහාද ලකුණු ලබාගැනීම පහසුවෙන් කළ හැකිව තිබුණි. ස්ව-අධ්‍යයන පොත පරිශීලනය නොකළ බවට කරුණු මැනැවින් අනාවරණය විය. ඉතාමත් සුළු පිරිසක් සම්පූර්ණ ලකුණු ලබාගත් අවස්ථාද දක්නට ලැබුණි. වෙනස යනු කුමක්ද යන්න විවිධාකාර අදහස් හා උදාහරණ උත්තර වශයෙන් ලබා දී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## C කොටස

මෙම කොටස සඳහා ප්‍රශ්න අංක 7 සිට 9 දක්වා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගතහැකි මුළු ලකුණු ප්‍රමාණය 30 කි. සමස්තයක් ලෙස මෙම කොටසෙහි කාර්යසාධනය සාර්ථක මට්ටමක තිබුණි.

### ප්‍රශ්න අංක 07

කළමනාකරණය සඳහා චර්යාත්මක ප්‍රවේශය සහ ප්‍රමාණාත්මක ප්‍රවේශය සම්බන්ධයෙන් යොමුකර තිබූ මෙම ප්‍රශ්නය කොටස් දෙකකට ඉදිරිපත් කර ඇත. ඉන් (a) **කොටසින්** චර්යාත්මක ප්‍රවේශයේ ඇති විවේචන 5 ක් හඳුනා දක්වන ලෙසත් ඉන් (b) **කොටසින්** ප්‍රමාණාත්මක ප්‍රවේශයේදී බහුලව යොදාගන්නා ශිල්පීය ක්‍රම 5 ක් සඳහන් කරන ලෙසටත් ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි.

මෙහි (a) **කොටස** සඳහා චර්යාත්මක ප්‍රවේශයෙහි ඇති විවේචන 5 ක් හඳුනා දක්වමින් අදාල මුළු ලකුණු ලබාගෙන තිබුණි. නමුත් (b) **කොටස** සඳහා බහුතරයක් අයදුම්කරුවන් උත්තර සපයා නොතිබුණි. තවත් සීමිත අයදුම්කරුවන් පිරිසක් ප්‍රමාණාත්මක ප්‍රවේශය යන්න විස්තර කර තිබුණි. කළමනාකරණ චින්තනය හැඩගැස්වීමෙහිලා බලපාන කළමනාකරණ ප්‍රවේශය හා කළමනාකරණයේ ඓතිහාසික පසුබිම පිළිබඳ ඇති දැනුම මඳකම අඩු ලකුණු ලබා ගැනීමට හේතු සාධක ලෙස දැක්විය හැකිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. එහි (a) **කොටසින්** අධිකාරිත්වය සහ වගකීම අතර සම්බන්ධතාවය පැහැදිලි කරන ලෙසටත්, එහි (b) **කොටසින්** සඵලදායි අධිකාරිත්වය පැවරීම කෙරෙහි ඇති බාධක 3 ක් පැහැදිලි කරන ලෙසටත් ඉදිරිපත් වී තිබුණි.

බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර සපයා තිබූ අතර, ඇතැම් සුළු පිරිසක් ප්‍රශ්නය නිසියාකාරයෙන් තේරුම්ගත් බවක් පෙනෙන්නට නොතිබුණි. ඔවුන් වගකීම සහ අධිකාරිත්වයේ සබඳතාවය ලිවීම වෙනුවට එහි වෙනස්කම් දක්වා තිබුණි. එසේම අධිකාරිත්වය පැවරීමේ බාධාවන් ලිවීම වෙනුවට අධිකාරිත්වය පැවරීමෙන් වන අවාසි ලියා තිබුණි. තවත් සමහරු උත්තර ලිවීමේදී විෂය කරුණු පිළිබඳ අවධානය යොමු නොකර කුමක් හෝ කරුණු ලිවීමට පෙළඹුනු අවස්ථාද නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 09

සංවිධානයක උපායමාර්ග පිළිබඳව ඉදිරිපත් වී ඇති ප්‍රශ්නයකි. ප්‍රශ්නය කොටස් දෙකකි. එහි (a) **කොටසින්** සංවිධාන උපායමාර්ගයන්හි ප්‍රධාන මට්ටම් 3 ක් පැහැදිලි කරන ලෙසත් එහි (b) **කොටසින්** හොඳ උපාය මාර්ගයක ලක්ෂණ දෙකක් පැහැදිලි කරන ලෙසත් දක්වා තිබුණි. මෙහි (a) **කොටස** සඳහා බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි. තවත් සමහරෙක් ප්‍රශ්නය හරිහැටි තේරුම් නොගෙන කළමනාකරණ මට්ටම් පිළිබඳව සඳහන් කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. තවත් ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර ලිවීම මගහැර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

මෙහි (b) **කොටස** සඳහා බහුතරයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සපයා නොතිබුණි. ඇතැම් අයදුම්කරුවන් උපායමාර්ගයක ලක්ෂණ දෙකක් සඳහන් කර තිබුණද පැහැදිලි කිරීම් දක්නට නොතිබුණි. ඒ හේතුවෙන් එම අයදුම්කරුවන්ටද අදාල මුළු ලකුණු ප්‍රමාණය ලබාගැනීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

### ප්‍රශ්න අංක 10

සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයකි. ඉදිරිපත් කරන ලද සිද්ධියට අදාලව න්‍යායාත්මක කරුණු ගොනුකරන ආකාරය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. (a), (b), (c) සහ (d) යනුවෙන් කොටස් 4 කින් ප්‍රශ්නය සමන්විතය.

**(a) කොටස**

මෙම කොටසින් **සීමාසහිත හනී ස්වීට්ස් සමාගමේ, M. සිල්වා මහතාගේ** නායකත්ව ශෛලිය තක්සේරු කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. සිද්ධියට අදාල නායකයන් දෙදෙනෙක් සඳහන් වුවත් කළමනාකරණ අධ්‍යක්ෂවරයා වන **සිල්වා මහතාගේ** නායකත්වය සිද්ධියට අදාල කරුණු උපුටා දක්වමින් හඳුනාගත යුතුව තිබුණි. නායකත්ව ශෛලීන් කිපයක් අනුගමනය කළ නොහැකිය. සිද්ධියට අදාල කරුණු අනුව අදාල නායකත්ව ශෛලිය හඳුනාගෙන ඊට ගැලපෙන කරුණු සිද්ධි ආශ්‍රයෙන් උපුටාගැනීම සුදුසු වේ. බහුතර අයදුම්කරුවන් පිරිසක් සාර්ථකව උත්තර සපයා තිබුණි. ඇතැම් අය කරුණු සිද්ධියෙන් උපුටා දක්වා තිබූ නමුත් නායකත්ව ශෛලිය නම්කර නොතිබූ අවස්ථා දක්නට ලැබුණි.

**(b) කොටස**

මෙම කොටසින් කළමනාකරුවෙකු හා නායකයෙකු අතර වෙනස්කම් 4 ක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. මෙම ප්‍රශ්නය ඍජුවම අසා ඇති හෙයින් කරුණු අධ්‍යයනය කර තිබූ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි. නමුත් ඇතැම් අයදුම්කරුවන් කළමනාකරු සහ නායකයා යන්න කෙටියෙන් නිර්වචනය කර තිබුණි.

**(c) කොටස**

මෙම කොටසින් අභිප්‍රේරණ න්‍යායක් ලෙස ද්විත්ව සාධක න්‍යාය සිද්ධියෙහි සඳහන් සමාගම සඳහා භාවිත කරන්න යන්න ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණි. මෙහිදී අභිප්‍රේරණ න්‍යායයන් දෙක සිද්ධියට අදාලව පැහැදිලි කළ යුතුය. අභිප්‍රේරණ න්‍යායයන් දෙක පැහැදිලි කිරීමට හා ප්‍රායෝගිකත්වය සිද්ධියට අදාල කර ගැනීම සඳහා ලකුණු ලබා දී ඇත. බහුතරයක් අයදුම්කරුවන් මෙම කොටසට උත්තර ලියා නොමැති අතර, ඇතැම් සීමිත අයදුම්කරුවන් පිරිසක් ද්විත්ව සාධක න්‍යාය ඉදිරිපත් කර තිබුණත් එය **සීමාසහිත හනී ස්වීට්ස් සමාගමට** අදාලව උත්තර සපයා නොතිබුණි.

**(d) කොටස**

මෙම කොටසින් **සීමාසහිත හනී ස්වීට්ස් සමාගමේ** සඵලදායී සාංගමික සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා **M. සිල්වා මහතාට** හඳුන්වාදිය හැකි ක්‍රියාවන් 4 ක් සඳහන් කරන ලෙස දක්වා තිබුණි. මෙම ප්‍රශ්නයට උත්තර ඉදිරිපත් කිරීමේදී සංවිධානමය සංස්කෘතිය කුමක්ද යන්න තේරුම්ගත යුතුය. සඵලදායී සංස්කෘතියක් නිර්මාණය කිරීමට ඕනෑම සංවිධානයක් අනුගමනය කළ හැකි ක්‍රියාවන් සඳහන් කිරීම පමණක් මුළු ලකුණු ලබාගැනීමට ප්‍රමාණවත්ය. නමුත් බහුතරයක් අයදුම්කරුවන්ට සඵලදායී සාංගමික සංස්කෘතියක් යන්න පිළිබඳව අවබෝධයක් නොමැති හෙයින් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීම දුර්වල මට්ටමක පැවතුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදී දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සැළකිලිමත් විය යුතුය.

(8) ඒඒටී ආයතනය මගින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -